# එඩිය



'බස රස
දෙස යා
නොකරත
පණ යා'

– කුමරතුඟු

කලබෙකැ මිල සත දහය යි.
දෙලොස් කලබෙකැ මිල රුපියල් එක යි සත පණහ යි.
දෙහිවලැ පියාලෙන් පාරේ නම්බර 1, එඩියේ සකසු :- අරිසෙන් අහුබුදු.

## හෙළ සස් අවි තරේ–ගනිවු හෙළයෙනි, නැගෙවු මෙ වරේ!

මුළු ලොවට සැබියා
රස ඉගැන් වූ හෙළයා
අද පිරිහෙත තියා
දකිත හා, හද සොවින් කකියා !

හිරු ගොත, එ මහ සමි –
මත මනුහු, හිරු හැඳූහුම්
හැම තැණ, ගුණ දහම්
අහෝ සව් විදු උපත් හෙළ බිම් !
මිසරය, පිනිසිය
අබිසෙනියාව, ගරසිය
අපිරිකා බිම් සිය
ඉඩම් කලවුන් ගෙ හැටි ගෙහි සිය !

සකුවට වදන් පෙළ
අරාබියට අකුරු වැල
වියරණ තියර අළ
ගරසි නැයනට, හාං බස හෙළ !
දඹ දිව් උවදුරේ
තො හෙළවු හෙළය ගොදුරේ
හෙළ සස් අවි තරේ
ගනිවු හෙළයෙනි, නැගෙවු මෙ වරේ !

# විහිළුව

අහුබුදු සඳුවන් විසිනි.

'අදත් අපි ඒ විහිළුව කරමු. අර අයියා ඉන්නේ' මෙ සේ කීයේ සුසිලා යැ. මට වයසින් මදක් වැඩි වුව ද සුසිලා උගත්තේත් මා හා එක ම ගොල්ලෙහි යැ.

'ඔව්, කරමු' යි ඇගේ කීමට එකඟ වෙමින් ඇය හා මිදුලට බැස්සෙමි මම. අයියා උන්නේ මිදුලේ පසෙකැ පිහිටි අඹ ගහ යටැ වූ බංකුව මතැ පොතක් කියවමිනි. ගෙට පිටිපා යැ උන්නේ. එ හෙයින් අයියා දෙසට යන අපි ඔහු ගේ ඇසට නො වැටුණෙමු.

දැන් අයියාත් අපත් අතරැ දුර දෙ බඹයකට වඩා නො වී. අපි නැවැතුණෙමු. 'ඉතින් ඔබ යන්නැ' යි. මම සුසිලා හට කීම් කනට කොඳුරා. 'අද මට බෑ; අයියා මං සමඟ තරහවුණා පා සලේ දී; ඔබ ගොස් ඒ විහිළුව කරන්නැ'යි මා ඉදිරියට තල්ලු කළා යැ සුසිලා.

මම බිමට නැමුණෙමි. සුසිලා බලා සිටියා යැ. මගේ දෑත දෙ දණ හිස මතැ යැ. දැන් මගේ වම් පය වම් අත ද ගෙනැ පෙරට යෙයි. දකුණු පය දකුණු අත ද ගෙනැ පෙරට යෙයි. මෙ සේ හොර බළල් ගමනින් තිනැඬියාවත් ඉදිබු ගමනින් ලැසියාවත් ගෙනැ හොරහොරා අයියා වෙතට පා නැඟීමි. එක වරැ මැ ඔහු ගේ හිස පිටිපසින් නැඟී, දෑතින් ඔහු ගේ ඇස් තදින් වසා - ලීමි.

අයියා අතෙහි වූ පොත බිම වැටෙන හඬ ඇසිණි. එහෙත් එ හඬ යට ලන බිහිසුණු හඬෙක් 'ටොක්' යනුයෙන් මා හිස මතැ පිපිරිණි. මා හිසින් ගිනි ද ඇසින් කණ මැදිරියන් ද පිටවන්නා සේ දැනිණි. මම මහ හඬින් හඬා - ගෙනැ ගෙට දිවැ ගියෙමි.

'මේක යස විහිළුවෙක් නොවැ, මට පතක් පොතක් බලන්නට හැටියෙක් නෑ. ' යි එහි වන් අයියා මා සනසන්නට බලන අම්මාට නඩුව කියේ යැ.

'ඇයි, පුතා, ඔබ නංගීට ඒ විදියට ටොකු අනින්නේ? බලන්න ඇගේ හිස ගෙඩිහැහී-ලා. ඇයට ඔබ ගෙන් ටොක්කක් කන්නට පිළිවන් ද' යි අම්මා අයියාට තරවටු කළා යැ.

''අයියා මට විතර යි ටොකු අනින්නේ සුසිලා අක්කා අවුත් එ සේ විහිළු කළාට ටොකු අනින්නේ නැහැ මා කළොත් හාමං වරද'' මම ඉකිගසමින් කීමි.

අයියා කතා නැති ව යන්නට ගියේ යැ. 'දුව හඬන්න එපා' යැ යි අම්මා මා හිස පිරිමදින් ම සුසිලා මා ඇස ඇගේ කුඩා ලේන්සුයෙන් පිසැ - දැමුවා යැ.

# බිම්කොසු වඩු වදන් වැල

චිනී විතාරණයන් විසිනි. (ගිය කලබ හා සබැඳෙ සි.)

Erosion, Mechanical / Corrasion
– අඟර කොංහොංල
[අඟර = ගැටීම]
Erruption – පිපිරුම
Escarpment – දළ බෑවුම; පල්ලම
Esker – එස්කරය
Estuary – මෝදර; මෝය
Evaporation – හුමාලයනය
[හුමාලය (vapour)
සෑදීම]
Expansion – විදෑසිය

F

Farming, Pastoral – එඬේර කම
Fault – පළුදුව
Fauna – සතුන්
Ferry – ගංතොට
Fiord – පියොදය
Fissure – විඩවුව
Flood water, Course of
– ගොඩවාත
Flora – ගස්කොළන්
Focus, Seismic – සැලුම් මැද
Fog – දුමෝළු
Fold – රැළිය; පිරිල්ල
Force, Centrifugal – මැදි'තළ බලය
(මැදින් + අළ)
Force, Centripetral – මැදට'ළ බලය
(මැදට + අළ)
Ford – තරය; පාදිය
Forecast. Weather – කල් ගුණ මතුපවසුව
Forest. Coniferous – කොන්දර වනය
Forest. Deciduous – පතළු වනය
[පත් + හළු]
Forest Equatorial – මහ නැබවිය'නු කැලෑව
Forest, Thorn – කටු කැලෑව
Forties, Roaring – ගැජුම් නැබවිය;
ගැජුම් සතලිසිය
Fossil – පොසිලි
[පස් + ඔල් (ගෙය) + ඉ (ඇති)
Front, Cold – ඇල් පෙරමුණ
Front, Warm – උණු පෙරමුණ
Frost – කුළු හිම

Furrow - 1. හලීය
2. හී වීථි

Fusion - පැලැනීය;
පිලිස්සිය

## G

Gale - සැඩ සුලඟ

Gap - කපොල්ල; හිදෑස්ස

Gas - ගැස්
[ගහස් මැ (ගහනුයේ) ගහස්]

Geology - පොළෝලකුව

Geo - Syncline - බැහි යටි රැලිය

Geyzer - විදූල (විදි + උඵල)

Glacier - හිම ගංගාව

Gneiss - පුළිඟු ගල
[Gneisti - spark - (පුළිඟු) Oxford Etl. Dict.]

Gorge - දෙරුව; කඳුර

Gradation, Grading
- තැනියනය [තැනි සැදීම]

Gradient - බෑවුම

Gradient, Pressure
- පෙළුම; වා බසුව

Grain - 1. වයිරම
[Banded structure]
- 2. වයිරිය [Particle]
(/වයි = සවි; තද මැ වූයේ 'වයිරි')
- 3. සස්; දහන්; බෝග

Granite - පුනක්කු ගල

Granular - වයිරි (වයිර + ඉ)

Gravitale - කෑදෙයි
[කා(පොළොව) + ඇදි]

Gravitation - කෑදියාව

Gravity - කෑදිය

Gulf - බොක්ක

## H

Haff - කලපුව

Hail - ගල්වැස්ස

Haze - පටල

Headland - තුඩුව; දඹ තුඩුව

Hemisphere - අඩගෝලය

Hill, Conical - කොත්කන්ද; කේතුකන්ද
[කෙතුවක් (cone) බඳු වූයේ]

Hill, Foot - පා කන්ද

Hillock - කඳුගැටය

Hinterland - පැසුලු බිම

Hole, Pot - කුඹු වල (කුඹු = Pot)

Hole, Sink - බෑසි වළ
Horticulture - ඉඩම් වගාව
Horizon - ක්ෂිතිජය
[ඉරේකා සහ (sign of a line) ඇතියේ]
Hot, Wet - උණු තෙත්
Humidity (of air) - වාතෙතමන
Humidity, Absolute - නිරපේක්ෂ වාතෙත
Humidity, Relative - බැඳි වාතෙත
Humidity, Soil - පස් තෙතමන
Humus - පෝර පස
Hurricane - හරිකේනය
Hydrology - දියලකුව
Hydrosphere - දියමඩල
Hygrometer - වාතෙතමනුව

I

Ice - ගල්හිම
Iceberg - ගල්හිම පහුර
Icecap - ගල්හිම කැපිය
[කා = හිස; පිය = වසනය; වැස්ම
කාපිය = කැපිය]
Icicle - හිමකුර
[Ref. Carter's Dictionary]
Inlet - කුඩා බොක්ක
Insolation - තැච්ච
Insular - මූහුදු
Ionosphere - අයනමඩල
Irrigation - දියළනය
[දිය + අළනය (සැපැයීම)]
Island - දිවයින; දූව
Island, Continental - මහදිව් දිවයින
Island, Oceanic - සයුරු දිවයින
Islet - කොදෙව්ව
Isobar - සමවාපෙළුම් ඉර
Isobath - සමගැඹර ඉර
Isohaline - සමකිවුල් ඉර
Isostacy - සමහොතය
(හොත් = පිහිටි)
Isotherm - සමුණු ඉර (සම + උණු)
Isthmus - බිම්ගෙළ

J

Joint - පැසිය

K

Karst - 'කාස්ත; හුණුගල්කරය
Knot - 1. කඳු පුරුකය
2. මුදු සැතැප්ම

## L

Laccolith – සුළු ගැබෝරසෙල
(ගැබ් + ඕර)

Lagoon – කලපුව

Lake, Ox-bow – කියදි විල
(කියදි = මොල්ලිය = hump)

Land - slide – බිම් හුරුව
('හුරා වැටුම' හුරුව යි.)

Laterite (Kab ouk) – කබුක්

Latitude – නැබවිය
[නැගෙනහිර සිට බටහිරට විහිදෙනුයේ නැබ යැ. නැබ වූයේ නැබවිය යි. (සවාජී තද්ධිත)]

Latitude, Horse – අස් නැබවිය

Lava – ලෝදිය

Leaching – දෝබස්නාව (දෝ=දිය)

Leap Year – වැඩි අවුරුද්ද

Leeward – පිළිතලමුණ

Levee – කාංගුව

Lights, Northern
(Aurora Borealis) – උතුරු පබාව

Light, Ray of – කදුඹුව; කිටුව

Limestone – හිරිසල

Limnology – විල්ලකුව

Line, Date – දින ඉර

Line, Fall – ඇලි ඉර

Line, Homoseismal – සමසැලුම්කල් ඉර

Line, Horizontal – හිරිසැනි ඉර
(Horizon = හිරිසන)

Line, Isoseismal – සමසැලුම් ඉර

Line, Snow – හිම ඉම

Line, Timber – කැලෑ ඉම

Lithology – සෙල්ලකුව

Lithosphere – සෙල්මඩල

Loam – වැලිමැට්ට

Loess – ලොවස

Longitude – උදවිය
[උතුරේ සිට දකුණට විහිදෙනුයේ උද යැ. උද වූයේ උදවිය යි. (සවාජී තද්ධිත)]

## M

Magma – ඝනලෝදිය

Marble – කිරිගරුඬ

Marl – සුදුමැටි

Marsh / Bog / Swamp
- වගුර; හැලි; ගොලහැලි; හොහොදුව; ගොහොරුව

Marsh, Salt - කර වගුර
Material, Raw - අමු දේ
Meander - දඟරය (vb. දඟරෙයි)
Meander, Incised - කැපි දඟරය
Melting - දියවීම; වීරුම
Metal - ලොහොව
Meteor - උල්කාව
Meteorite - උළුසෙල (උළු = star)
Meteorology - වාගුණලකුව
Mineral - කාදුත (කා + දුත = පොළොවෙහි උපන්නෝ)
Mineralogy - කාදුතුලකුව
Mirage - මිරිගුව; මුවතණ
Mist - මීදුම
Moisture - හිරිකඩ
Monocline - තනිරැළිය
Monsoon - මෝසම
Morraine - මොරේනය
Mountain - කන්ද; පව්ව; ගිර

Mountain, Block / Horst
- අවොත් කන්ද (අවොත් = නැගුණු); හෝස්ටය

Mountain, Fold
- රැළි කන්ද

Mountain, Residual
- අතියුණු කන්ද

Mountain, Young Folded
- යොවුන් රැළි කන්ද

**N**

Nebula - වංතරුව
Nomadism - අටන - එඬේරියාව

**O**

Oasis - සොම්බිම
Observation - ඔවික්සුම (ඔ + ඉක්සු = මනා සේ බලන)
Observatory - ඔවික්සුපොළ
Occlusion - ඇවුනය [ඇල් පෙරමුණත්, උණු පෙරමුණත් එක්වීම (ඇ + උනය) ඇවුනය යි.]

| | |
|---|---|
| Ocean | – සයුර |
| Oceanography | – සයුරුසතර |
| Ooze (N.) | – කාඩිය; කදම |
| Ooze (V.) | – සිළියේ |
| Orbit | – සැරිය |
| Ore | – ලෝපස |
| Organism | – සදිවිය (දිවි සහිත වූයේ) |
| Orogenesis | – කඳුදනනය |
| Orthomorphism | – හැඩසරියාව |
| Outcrop | – මතුවනය (vb. මතුවෙයි) |
| Outlier | – අපසරය |

## P

| | |
|---|---|
| Pass | – 1. දුදුල; කපොලු පාර<br>2. පහත් කපොල්ල |
| Pasture | – තණබිම |
| Pattern, Drainage | – බස්නා හැඩය |
| Peak | – කුළ; මුදුන; හිස |
| Peak, Pyramidal | – පිරමිදනු කුළ |
| Peat | – කොළසෙල |
| Pedalogy | – පස්ලකුව |
| Peneplane | – අඩාළතලාව<br>(අඩාළ = incomplete) |
| Peninsula | – අඩදිව |
| Percolation | – වෑහිම |
| Petrology | – සෙල්ලකුව |
| Plain | – තැනිතලාව; තැන්න |
| Plain, Coastal | – වෙළ'තැ තැනිතලාව |
| Plain, Deepsea | – ඇද්දිය - තලාව |
| Plain, Flood | – වතුරු තලාව;<br>පිටාර ,, |
| Plane, Bedding | – තට්ටු තලය |
| Plane Fault | – පළුදු තලය |
| Plane, Inclined | – නැඹුරු තලය |
| Plane, Thrust | – වූනුටු තලය |
| Planet | – ගහයා |
| Planetable | – පෙතැල්ල |
| Plantation | – වගාව |
| Plateau | – උස්තලාව |
| Plateau, Dissected | – බෙදුනු උස්තලාව |

එහියෙහි සකාසුවාණන් වෙනුයෙන් අමරසෙන් අහුතුසුවන් විසින්
උණවටුනේ පිහිටි ඔවුන් ගේ 'හේළි' පහරුයෙහි පහරවා
පළ කැරිණි.